# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**

**තැ.පෙ. 1503, කොළඹ**

**අ.පො.ස. (සා.පෙළ) විභාගය**

**ඉංග්‍රීසි මාධ්‍යය උත්තරපත්‍ර ඇගයීම සඳහා පරීක්ෂකවරුන්ගේ සංචිතයක් පිහිටුවීම**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අ.පො.ස.(සා.පෙළ) විභාගයේ පහත සඳහන් විෂයයන්වල ඉංග්‍රීසි මාධ්‍යය උත්තරපත්‍ර ඇගයීම සඳහා පරීක්ෂකවරුන්ගේ සංචිතයක් පිහිටුවීමට සුදුසුකම් ලත් දැනට සේවයේ නියුතු රාජ්‍ය හෝ උපකෘත පාසල්වල ගුරු භවතුන්ගෙන් හා ඇගයීම් කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති 2015.01.01 දින පසු විශ්‍රාමික ගුරුභවතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. උත්තරපත්‍ර ඇගයීම් කටයුතු කොළඹ දී සිදු කිරීමට නියමිත ය.

අදාළ විෂය ලේඛනය

- 11 - බුද්ධ ධර්මය
- 14 - කතෝලික ධර්මය
- 15 - ක්‍රිස්තු ධර්මය
- 16 - ඉස්ලාම්
- 32 - ගණිතය
- 33 - ඉතිහාසය
- 34 - විද්‍යාව
- 41 - සංගීතය (අපරදිග)
- 43 - චිත්‍ර
- 85 - ගෘහ ආර්ථික විද්‍යාව
- තාක්ෂණික විෂයයන්

සුදුසුකම්

01. රාජ්‍ය හෝ උපකෘත පාසලක අ.පො.ස. (සා.පෙළ/ උ.පෙළ) සඳහා උක්ත විෂයයන් හි ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමේ වසර 05 ක සේවා පළපුරුද්ද

02. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උත්තරපත්‍ර ඇගයීමේ හැකියාව. (පළපුරුද්ද සනාථ කල හැකි ලියකියවිලි ඉදිරිපත් කරන්න.

03. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ.පො.ස. (සා.පෙළ/ උ.පෙළ) ඇගයීම් කටයුතු සඳහා සම්බන්ධ වී තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

04. සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසුව සේවය අවශ්‍යතාවය අනුව බඳවා ගැනීම සිදුකෙරේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියෙන් බාගතකර ගත් අදාළ ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර 2019 ජනවාරි මස 07 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, ඇගයීම් (පාසල් විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ. යන ලිපිනයට තැපැල් මගින් එවන්න.

බි. සනත් පූජිත

විභාග කොමසාරිස් ජනරාල්